# <u>ලංසු ආරාධනාවයි!</u>

..........................................

...........................................

...........................................

<u>පුත්තලම දිස්ත්‍රික් ලේකම් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ඇති වාහන 41 ක් රක්ෂණය කිරීම සඳහා විවෘත ලංසු කැඳවනු ලැබේ.</u>

උක්ත කරුණ සඳහා ම' විසින් ලංසු කැඳවනු ලැබේ.

02. ඒ අනුව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන 41 ක් 2021 ජනවාරි මස 01 දින සිට 2021.12.31 දින දක්වා පූර්ණ රක්ෂණය කිරීම කිරීම සඳහා පහත ලංසු කොන්දේසි වලට යටත්ව ඔබගේ අවම මිල ගණන් ඉදිරිපත් කරන ලෙසට කාරුණිකව දන්වමි.

03. මේ සඳහා වන ලංසු කැඳවීම 202.11.30 දින සිට 2020.12.21 දින දක්වා සිදු කරනු ඇත. <u>ඔබගේ අවම මිල ගණන් 2020.12.21. දින පෙ.ව 10.00 ට පෙර ලැබෙන සේ</u> "වාහන රක්ෂණය කිරීම සඳහා මිල ගණන්" යනුවෙන් සඳහන් කර, සභාපති / දිස්ත්‍රික් ලේකම්, ප්‍රසම්පාදන මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලන ලෙසට කාරුණිකව දන්වමි.

04. එකී වේලාව ඉක්ම වූ වහාම ලංසු විවෘත කරනු ලබන අතර, ඉන් පසුව ලැබෙන මිල ගණන් බාරගනු නොලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ඔබට හෝ ඔබ විසින් විධිමත් අයුරින් බලය පැවරූ නියෝජිත මහතකුට සහභාගී වීමට පුළුවන.

05. ඔබගේ ලංසු භාර ගැනිම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අවසන් බලය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතු වන බව ද වැඩි දුරටත් දන්වමි.

06. ලංසු ඉදිරිපත් කිරීමට පෙර වාහනය පරීක්ෂා කිරීම අවශ්‍යනම් 2020.11.30 දින සිට 2020.12.18 දින දක්වා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී සහ පුත්තලම දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 දී සතියේ වැඩ කරන දිනවල කාර්යාල වේලාව තුළ දී සිදු කළ හැකිය.

07. වැඩි විස්තර පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, 032 – 2265233 හා 2265335 දුරකථන අංක මගින් සහ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 031- 5679171 හා 031 - 5679174 දුරකථන අංක මගින් ලබා ගත හැක

(එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර) ,

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

පුත්තලම

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
පුත්තලම.
2020.12.

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වාහන සඳහා පූර්ණ රක්ෂණාවරණය ලබා ගැනීම සඳහා වන ලංසු කොන්දේසි.**

එක් එක් වාහනය සඳහා වන තක්සේරු වටිනාකම් මේ සමග ඇත. එම එක් එක් වාහනය සඳහා වෙන වෙනම මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. එසේ එක් එක් වාහනය සඳහා අවම ලංසුව ඉදිරිපත් කරන ආයතන වෙතින් රක්ෂණය සිදු කරනු ඇත.

02. ඒ සඳහා පහත සඳහන් රක්ෂන ආවරණ සඳහා එකග වන්නේ ද නැද්ද යන්නත්, ඊට අමතර රක්ෂණ ආවරණ ඇත්නම්ඒ බව ඇමුණුමක් මගින් ඉදිරිපත් කළ හැකිය. එම රක්ෂණ ආවරණයේ අවශ්‍යතාවය මත ඊට ප්‍රමුඛතාවයක් දෙනු ඇත. රක්ෂ

03. අප විසින් ලබා දෙනු ලබන තක්සේරු වටිනාකමටම රක්ෂණ ආවරණ ලබා දිය යුතු අතර ඔබගේ සිතැඟි පරිදි වටිනා කම වෙනස් කළ නොහැක.

04. පහත සඳහන් අවස්ථා ගැන ද විශේෂ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටිමි.

i. දීප ව්‍යාප්ත ශාඛා ජාලයක් තිබීම.
ii. ආයතනය මගින් ලබාදීමට හැකි වෙනත් පහසුකම් හා සේවාවන්.
iii. අනතුරට ලක්වූ වාහනයක් අලුත් වැඩියාවක දී සමාන වාහනයක් ලබාදීම.
iv. ලබාදිය හැකි වට්ටම්.
V. වෙනත් අවස්ථා.

| | | එකඟ වේ/ඇත | එකඟ නොවේ. නැත |
|---|---|---|---|
| 1 | ආපදා/කෝලහල/ගිණිගැනීම්/බාහිරපිපිරීම්/සොර බිය/ද්වේශ හානි වැනි අවස්ථා ආවරණය . | | |
| 2 | අනතුරකදී ඇදගෙනයාමේ දී හා පටවාගෙන යාමේ දී ඒ සඳහා ආවරණය. | | |
| 3 | මහා මාර්ග, දුම්රිය මාර්ග, අභ්‍යන්තර ජල මාර්ග ඔස්සේ (ගංවතර) හෝ විදුලි මඟින් මගින් සිදුවන හානි. | | |
| 4 | ප්‍රමුඛ පාරිභෝගිකයින් උදෙසා(මාණ්ඩලික නිලධාරීන් ) අනතුරක් සිදුවූ විට එය දන්වා එම ස්ථානයෙන් ඉවත්ව යාමේ VIP පහසුකම. | | |
| 5 | අනතුරකදී වන්දි හිමිකම් කඩිනමින් ගෙවීමේ හැකියාව. (කාලය සහ මුදල වෙනම සටහන් | | |

| | | | |
|---|---|---|---|
| | කරන්න) | | |
| 6 | අනතුරක දී අප ආයතනයේ ලියා පදිංචි වී ඇති අනුමැතිය ලත් ගරාජ වලින් අලුත්වැඩියා කරගත හැකිවීම. | | |
| 7 | හිමිකම් නොපෑමේ ප්‍රසාද දීමනාව වාර්ෂිකව වැඩිවීම. | | |
| 8 | පෙර රක්ෂණ ආයතනවලින් ලබාදෙමින් තිබෙන හිමිකම් නොපෑමේ ප්‍රසාද දීමනාව අඛණ්ඩව ලබාදීමට ඇති හැකියාව. | | |
| 9 | කුඩා හිමිකම් සඳහා හිමිකම් නොපෑමේ ප්‍රසාද දීමනාව අඩු නොකිරීම. | | |
| 10 | 100% ක එයා බෑග් ආවරණය. (දැනට එයා බෑග් ඇති රථ වලට) | | |
| 11 | වාහනයේ වටිනාකම් අනුව අඩු කිරීමකින් තොරව වන්දි මුදල් ලබාදීම. (ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කරන්න) | | |
| 12 | රක්ෂණය අලුත් කිරීමේදී සහන කාලයක් ලබාදීම. | | |
| 13 | කම්කරු වන්දි රක්ෂණය. | | |
| 14 | ගමන් කරන නිලධාරීන් සඳහා නොමිලේ රක්ෂණාවරණ ලබා දීම(විස්තරයක් ලබා දෙන්න) | | |
| 15 | වාහනයේ ගමන් කරන අනෙකුත් අයට රක්ෂණාවරණ ලබා දීම(විස්තරයක් ලබා දෙන්න) | | |
| 16 | දිවයිනපුරා හදිසි අනතුරු අවස්ථා ආවරණය. | | |
| 17 | පැය24/දින 7 පුරා අනතුරු පරීක්ෂක නිලධාරීන් ගේ දිවයින පුරා සේවය. | | |
| 18 | දවසේ පැය24 පුරා, වසරේ දින 365 ම පාරිභෝගික සේවා ඇමතුම් ලබා ගැනීමේ හැකියාව. | | |
| 19 | මහමගදී වාහන අබලන්වීම, සුළං බැසීම වැනි ආපදා අවස්ථාවල දී සහන සේවා පැය 24 සහ දවස් 365 පුරාම ලබා දීම. | | |
| 20 | රථ වාහන හිමිකම් මුදල් ගෙවීමේදී ඒ සඳහා ගත වන කාලය උපරිම මාසයක් නොඉක්ම විය යුතුයි. | | |

ඉහත ලංසු කොන්දේසි වලට එකඟව අප ආයතනයේ ලංසු මිළ ගණන් මේ සමඟ ඉදිරිපත් කරමි.

කළමණාකරු/බලයලත් නිලධාරී

(රබර් මුද්‍රාව තබන්න)

නම -

ලිපිනය -

දුරකථන අංකය